# දඟකාර පූස් පැටියා සහ මලිති

M. මිහිසරණි තැන්න ගුණවර්ධන



# දඟකාර පූස් පැටියා සහ මලිති

M. මිහිසරණි තැන්න ගුණවර්ධන

4 - E

මහ/මහාමායා බාලිකා විදුහල - මහනුවර

කතෘ ප්‍රකාශනයකි 2024

978-624-208-624-8

# පිදුම

මෙම පොත සෑදීමට

මා හට මග පෙන්වූ

මාගේ ආදරණීය දෙමාපියන්ටත්

ගුරු මෑණියන්ටත්

මෙම පොත

ගෞරවයෙන් පුද කරමි.

# පෙරවදන

සාහිත්‍යය දියුණුව රටක සංවර්ධනය මනින මිනුම් දණ්ඩකි ලක් ඉතිහාසයේ කෝට්ටේ, දඹදෙණි යුග කැපීපෙනෙන්නේ ද සාහිත්‍යමය වශයෙන් ප්‍රබෝධවත් කාලපරිච්ඡේද නිසාය. එසේ නම් මහාමායා ඉතිහාසයේ ද සාහිත්‍යමය වශයෙන් ස්වර්ණමය අවධිය මෙයයි දැනට වසර ගණනාවක සිට අපගේ දියණියන් ග්‍රන්ථකරණය තුළින් විස්කම් පෑම එයට හේතුවයි. පාසල තුළ පොත් ලියන සංස්කෘතියක් ගොඩ නගා එය රටේම පාසල් පද්ධතියට ව්‍යාප්තකර මෙවර ගෝලිය ශිෂ්‍ය ප්‍රජාව ම ඊට සම්බන්ධ කරගැනීමට අප ගත්කතුවරියන් සමත්වීම සුවිශේෂ සිදුවීමකි.

ඉන් ඔබ්බට යමින් මෙවර පාසල් ප්‍රජාවම ආදි කතෘ කරඳන අත්ථදස්සි මාහිමිපාණන් වහන්සේට උපහාර පිණිස අතීත යතිවර ලේඛක සම්ප්‍රදාය රට තුළ යළි ගොඩනගන්නට පිරිවෙන් ශිෂ්‍ය භික්ෂුන් වහන්සේලා ද ග්‍රන්ථකරණයට යොමුකරන **“හෙරණගත්කරණී”** ව්‍යාපෘතිය හඳුන්වා දෙන්නට විය.

මෙම ශාස්ත්‍රිය සහ ශාසනික සේවාවෙන් රටේ පාසල් අධ්‍යාපනයේ සහ පිරිවෙන් අධ්‍යාපනයේ ගුණාත්මක වෙනසක් ඇතිකරන්නට නායකත්වය දීමට ලැබීම එහි විදුහල්පතිනිය වශයෙන් මා හට අභිමානයක් වන අතරම පාසලක් වශයෙන් ලබන ජයග්‍රහණයක් ද වෙයි. ජීවිතයේ මුල් අවධියේම තම සහජ කුසලතාව හඳුනාගනිමින් ලේඛන කරණයට යොමුවීමේ ප්‍රතිඵලයක් ලෙස එළිදකින මෙම කෘතිය ඉදිරි අධ්‍යාපනය සඳහා මෙන්ම අනාගත දිවිය සදහා අත්වැලක් වනු නො අනුමානය.

විදුහල්පතිනිය,

ශශිකලා සේනාධීර,

මහාමායා බාලිකා විද්‍යාලය - මහනුවර.

# දඟකාර පූස් පැටියා සහ මලිති.

කන්දක් පාමුල ලස්සන  පුංචි ගෙයක් තිබුණා.
ඒ ගෙදර ලස්සන පුංචි ගැහැණු  ළමයෙක් හිටියා.
එයාගේ නම මලිති.
ඇය හරිම කරුණාවන්තයි.



එක දවසක් ඉස්කෝලෙ ඇරිලා
ගෙදර එනකොට
පාර අයිනේ ලස්සන පුංචි පූස් පැටියෙක්
ඉන්නවා දැක්කා.
උෟ හරිම ලස්සනයි.
මලිති පූස්  පැටියා ළඟට යන්න හදනකොටම
පූස් පැටියා මලිති ළඟට දුවගෙන ආවා .



මලිතිට හිතුණා පූස් පැටියා
ගෙදර ගෙනියන්න.
ඌට අම්මා අකමැති වෙයි කියලත්
මලිතිට හිතුණා.
එහෙත් මලිති ට පූස් පැටියා
දාලා යන්න දුකයි.
මලිති පූස් පැටියාව
අරගෙන ගෙදර ගියා.



මලිති අම්මටයි තාත්තටයි

පූස් පැටියාව පෙන්නුවා .

මම මේ පැටියා ගෙදර තියාගන්නද?

කියලා අම්මා ගෙන් ඇහුවා.

අම්මා නම් ඒකට කැමති වුණේ නෑ.

මලිතිට හරියට දුක හිතුණා.



ඉතින් මලිති  පූස්  පැටියාව අරගෙන

එයාගේ යාළුවෙකුගේ ගෙදර ගියා.

ඊට පස්සේ පූස් පැටියාව

ඒ ගෙදරට භාරදීලා මලිති ගෙදර ගියා.





පාසැල් වැඩ සියල්ල අවසන්කර

මලිති නිදාගන්න යද්දි එයාට පේනවා

ජනෙල් පඩිය උඩ  මොකෙක් හරි ඉන්නවා කියලා.

ඉතින් මලිති හෙමින් හෙමින්

ජනේලය ළඟට ගිහිල්ලා බැලුවා.

බලනකොට එතන ලස්සන සුදු පූස් පැටියෙක් .

ඒ දවල් මලිති ගෙනාව පූස් පැටියා.

මලිතිට හරිම පුදුමයි.

මලිති පූස් පැටියව පෙට්ටියකට දාලා

ඇඳ යටින් තිබ්බා.

උදේ මලිති නැගිටලා
පෙට්ටියේ පූස් පැටියා ඉන්නවද? කියලා බැලුවා.
ඒත් පූස් පැටියා පෙට්ටිය ඇතුලේ හිටියේ නෑ.
මලිති පූස් පැටියාව හැම තැනම හෙව්වා.
පූස් පැටියා නැවත එයාගේ ගෙදර යන්න ඇති කියලා
මලිතිට හිතුණා .
නිකමට මලිති සාලයට එබිලා බැලුවා.
එතකොට පූස් පැටියා සාලේ පුටුවක
නිදාගෙන ඉන්නවා දැක්කා.
මලිතිට හරී සතුටුයි.
මලිති පූස් පැටියාව අරගෙන
පෙට්ටියේ දාලා නැවත ඇඳ යටින් තිබ්බා.
මලිති පූසාට කෑම ටිකකුත් දීලා උදේම පාසල් ගියා.



මලිතිට පාසලේ ඉගෙනගන්න අතරෙන්
මතක් වෙන්නේ පූස් පැටියාවමයි.
ඇයට ඉස්කෝලේ ඇරෙනකල් ඉවසිල්ලක් නෑ.
ඇය යාලුවන්ට පූසාගේ විස්තරේ කිව්වා.
යාළුවන්ටත් ආස හිතුණා පූසාව බලන්න.
ඉස්කෝලේ ඇරුණ ගමන්ම
මලිති ගෙදර දුවන්න ලෑස්ති වෙනකොටම
මලිතිගේ යාලුවෝ ඇගේ පස්සෙන් දුවන් ආවා,
අපිත් එනවා පූස් පැටියා බලන්න කියමින්.



මලිති සහ යාළුවෝ ගෙදර එනකොට
පූස් පැටියා අම්මගේ නූල් බෝලයකින්
සාලයේ සෙල්ලම් කරමින් හිටියා.
යාළුවන්ටත් පූස් පැටියාට ආදරේ හිතුණා .
මොකද කලබලේ කියමින් අම්මා
ගේ ඇතුලේ ඉඳලා දුවගෙන ආවා.
අම්මා දැක්කා ළමයි එක්ක
හුරතල් වෙමින් ඉන්න පූස් පැටියාව.
අම්මටත් පූසා ගැන ආදරයක් ඇතිවුණා.



නැවත මලිති අම්මගෙන් ඇහුවා
අපි මෙයාව තියාගමුද? කියලා
අම්මාටත් දුක හිතිලා
පූස් පැටියාව තියාගන්න අවසර දුන්නා.
මලිතිටයි යාලුවන්ටයි හරිම සතුටුයි.
ඊට පස්සේ  පූස් පැටියයි මලිතියි
සතුටින් ජීවත් වුණා.



M. මිහිසරණි තැන්න ගුණවර්ධන

4 - E

***මහ/මහාමායා බාලිකා විදුහල - මහනුවර***



## පසුවදන

රටේ අනාගත සංවර්ධනයට ඉවහල්වන සාහිත්‍යය ප්‍රබෝධයත් අධ්‍යාපනයේ ගුණාත්මක දියුණුවත් සාහිත්‍ය නිර්මණකරණය විභවතා කොටගත් අනාගත පරපුරේ හැකියාවන් ඔප්නැංවීම සහ එළිදැක්වීමට වේදිකාවක් ගොඩ නැගිම වැනි බහුවිධ පරමාර්ථ ඇතිව 2014 වසරේ පටන් මාගේ සංකල්පයකට අනුව ක්‍රියාත්මක පාසල් දරුවන් ග්‍රන්ථකරණයට යොමුකරන ක්‍රියාමූලික පර්යේෂණ ව්‍යාපෘතිය යටතේ මේ වන විට ලේඛක අංකුර හැට දහසකට වැඩි ප්‍රමාණයක් දේශිය සාහිත්‍ය කෙතේ රෝපණය කිරිමට ලැබිම අප ලැබූ භාග්‍යයකි. එම බීජ දළුලා වැඩෙන්නට අවැසි සරු පසක් සැකසිම සමාජ වගකීමයි. පාසලක් මුල්වීමෙන් අධ්‍යාපනයේ ඵලදායිතාව වෙනුවෙන් වසර ගණනාවක් අඛණ්ඩව පාසල් කලාප, පළාත්, ජාතික සහ ජාත්‍යන්තර තලය දක්වා ක්‍රියාත්මක කර ඇති මෑත ඉතිහාසයේ එකම ව්‍යාපෘතිය මෙයයි.

මෙවර ඒ සඳහා පිරිවෙන් ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලා ද සම්බන්ධ කර ගැනිම විශේෂත්වයකි. මෙහිදි මහාමායා බාලිකා විද්‍යාලයේ විදුහල්පති තුමිය, දියණියන්, ගුරුභවතුන්, දෙමාපියන් සහ ආදි ශිෂ්‍යාවන් දැක්වූ කැප කිරිමට ජාතියේ ප්‍රණාමය හිමිවිය යුතුය.

මුද්‍රිත පොත තවමත් අපේ අධ්‍යාපනයේ ප්‍රධාන මෙවලමයි. පොතකින් දරුවෙකුට ලැබෙන ආස්වාදය අන් කිසිවකින්වත් ලබාදිය නොහැකිය. මානව දැනුම ගබඩාකර තැබීමට විවිධ විද්‍යුත් උපාංග භාවිතයට එක්වීමත් සමඟ දරුවන් එයින් දුරස්වීම අධ්‍යාපනයේ ගුණාත්මක බවට අනර්ථකාරි මෙන්ම සමාජය තුළ විවිධ ගැටලු ප්‍රශ්න නිර්මාණය වීමට හේතු වී ඇති බව පර්යේෂණාත්මක ව සනාථ වෙයි. මෙයට පිළියම් වශයෙන් ක්‍රියාත්මක මෙම ව්‍යාපෘතියෙන් වසර ගණනාවක් මුද්‍රිත පොත් රචනාකර ඩිජිටල් තාක්ෂණය යුගයේ ස්මාර්ට් බාල පරම්පරාව නූතන තාකෂණය සමග ගළපමින් දැනට වසර දෙකක සිට රටේම පාසල් දරුවන් සමග එක්ව විද්‍යුත් කෘති රචනාකරයි. තම නිර්මාණ ජාත්‍යන්තර පාඨකයන් වෙත ගෙනයාමට මහාමායා බාලිකාවයන් ඩිජිටල් වේදිකාවක් ගොඩනගා දි, තිබේ තම නිසඟ, සාහිත්‍ය නිර්මාණ හැකියාව තුළින් එයට පිවිසි පුංචි ගත්කතුවර ඔබගේ ලේඛන දිවියට මගේ සුභාෂිංසන.

ව්‍යාපෘති නිර්මාතෘ සම්බන්ධිකාරක,
සෙනෙවිරත්න මහලේකම්

978- 624- 208- 624- 8